# 5 ශ්‍රේණිය

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## 02. අපි ලක් වැසියෝ – (We are Sri Lankans)


බහු ජාතික, බහු ආගමික, බහු සංස්කෘතික ජන සමාජයක් සහිත දේශයක් ලෙස සාමූහිකව හා සහජීවනයෙන් යුතුව අපි සියලු දෙනාම "ශ්‍රී ලාංකිකයෝ" යන හැඟීමෙන් එක්ව ජීවත් වීමට පුරුදු වෙමු.



සැකසුම - ගිරිඋල්ල මහින්ද ප්‍රා.වි.

අපේ රටට ගෞරවයක් ගෙන ආ ශ්‍රී ලාංකිකයින්

- ක්‍රීඩා ක්ෂේත්‍රය



**1.ඩන්කන් වයිට් මහතා**

**(1948 ලන්ඩනයේ පැවති ඔලිම්පික් උළෙලේදී මීටර 400 කඩුළු පැන දිවීම තරගයෙන් රිදී පදක්කම දිනා ගන්නා ලදී.)**




**2.සුසන්තිකා ජයසිංහ මිය**

**(2000 වසරේදී ඔස්ට්‍රේලියාවේ පැවති ඔලිම්පික් උළෙලේදී මීටර 200 දිවීමේ තරගයෙන් රිදී පදක්කම දිනා ගන්නා ලදී.)**



**4.** **ප්‍රදීප් සංජය මහතා**


**(2012 ලන්ඩන් පැරා ඔලිම්පික් උළෙලේදී ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදී.**



**3.අර්ජුන රණතුංග මහතා**

**(1996 ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය දිනා ගන්නා ලදී.**


- චිත්‍රපට



**ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා**


**(රේඛාව, ගම් පෙරළිය, කලි යුගය, යුගාන්තය යන චිත්‍රපට වල චිත්‍රපට අධ්‍යක්ෂ වරයාය.)**

- වේදිකා නාට්‍ය



1. ලූෂන් බුලත්සිංහල මහතා

(කවියෙකු, රංගධරයෙකු හා නාට්‍ය නිෂ්පාදකවරයෙකු වන අතර තාරාවෝ ඉගිලෙති නාට්‍යය ඔහුගේ නිර්මාණයකි.



2. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

(මනමේ, සිංහබාහු, කදා වළලු යන වේදිකා නාට්‍ය මෙතුමාගේ නිර්මාණ වේ.)

- නව නිපැයුම්



1. ඒ. එන්. එස්. කුලසිංහ මහතා

(පෙරසවි කොන්ක්‍රීට් ක්‍රමය සොයාගන්නා ලදී. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, සම්බුද්ධ ජයන්ති චෛත්‍යය, කොත්මලේ මහවැලි මහා සෑය හා කළුතර චෛත්‍යය මෙතුමාගේ ඉදිකිරීම් වේ.)



2. ප්‍රීති ගුණරත්න මහත්මිය


(ජාන විද්‍යාත්මක සොයාගැනීම්)

- විද්‍යාත්මක පර්යේෂණ



1. ආචාර්ය සරත් ඩී ගුණපාල


(නාසා ආයතනයේ භෞතික විද්‍යා විද්‍යාඥවරයෙකි.)



2. නලින් චන්ද්‍ර වික්‍රමසිංහ


(තාරකා විද්‍යාඥයෙකි.)

- සංගීතය



1. පන්ඩිත් අමරදේව මහතා

(රාගධාරී සංගීතඥයෙක් මෙන්ම වාදකයෙකි.)



2. සනත් නන්දසිරි මහතා

(ශාස්ත්‍රීය සංගීතඥයෙකි.)

# <u>ජාතික සංකේත හා ලාංඡන</u>

- ජාතික කොඩිය




- ❖ රතු පැහැති පසුබිම - ජාතික අභිමානය
- ❖ කහපැහැති සිංහ රූපය - සිංහල ජාතිය
- ❖ තැඹිලි හා කොළ තීරු - දමිළ ,මුස්ලිම් ජාතීන්
- ❖ කොඩිය වට කහපාට තීරුව - ජාතීන් අතර එකමුතුව
- ❖ බෝපත් සතර - මෙත්තා,කරුණා,මුදිතා, උපේක්ඛා  යන සතර බ්‍රහ්ම විහරණ

- ජාතික ගීය



- රාජ්‍ය ලාංඡනය



- පුන් කලස — සෞභාග්‍යය හා පරිපූර්ණබව
- වී කරල — ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය
- සිංහ රුව — රට හා විනය ගරුක ජනතාව
- ධර්ම චක්‍රය — ධර්මය
- ඉර හා හඳ — සදාතන පැවැත්ම

- ජාතික පක්ෂියා




වළි කුකුළා

- ජාතික වෘක්ෂය



නා ගස

* ජාතික පුෂ්පය



නිල් මහනෙල් මල

* ජාතික ක්‍රීඩාව



අත් පන්දු

* ජාතික සත්ත්වයා



දඬු ලේනා

# ප්‍රදේශවලට ආවේණික සුවිශේෂ ලක්ෂණ හඳුනාගන්නා කරුණු

1. ආහාර වර්ග
2. පාන වර්ග
3. ගස් වැල් වර්ග
4. සතුන් වර්ග
5. භූමියේ සුන්දර බව
6. ආවේණික බෝග වර්ග
7. විශේෂ ක්‍රීඩා/ප්‍රදේශයට ආවේණික ජන ක්‍රීඩා
8. සිරිත්, විරිත් වර්ග
9. ප්‍රාදේශීය භාෂා වර්ග
10. දේශගුණය හා කාලගුණය
11. සංස්කෘතික ලක්ෂණ

මෙම කරුණු ශ්‍රී ලංකාවේ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස්කම් වලින් යුක්තය.

## අපට ආවේණික අපේ උරුම

- **ඉපැරණි ස්ථාන**



**ජය ශ්‍රී මහා බෝධිය**



**ශ්‍රී දළදා මාළිගාව**



**සීගිරිය**

- දේශීය කැටයම්



ගොක්කොළ



ලී කැටයම්



පිත්තල කැටයම්

- නටබුන්




ලෝවා මහා ප්‍රාසාදය




පොළොන්නරුව රජමාළිගය


- ගල් කැටයම්



ඉසුරුමුණි පෙම් යුවල



සමාධි පිළිමය




අවුකන බුදු පිළිමය

- මූර්ති



තොලුවිල පිළිමය



සමාධි පිළිමය



මාළිගාවිල පිළිමය

- පෙරහැර




දළදා පෙරහැර




කතරගම පෙරහැර




සමන් දේවාල පෙරහැර

- ජන ක්‍රීඩා



පංච දැමීම



ඔළිඳ කෙළිය



මේවර කෙළිය

- රූකඩ හා වෙස්මුහුණු



රූකඩ



වෙස්මුහුණු

- සටන් ක්‍රම



අංගම් පොර

- ශාන්ති කර්ම හා කෙම් ක්‍රම



ශාන්ති කර්ම




කෙම් ක්‍රම

# <u>ශ්‍රී ලංකාවේ ලෝක උරුම</u>



ජය ශ්‍රී මහා බෝධිය



දළදා මාළිගය



සීගිරිය



සිංහරාජ වනාන්තරය

## කලා හා සංස්කෘතික උරුමයන් වර්තමානයේ විනාශ වීමට බලපා ඇති හේතු.

1. නොසලකා හැරීම
2. හානිකර දේ කිරීම
3. අගය නොකිරීම
4. වටිනාකම් හඳුනා නොගැනීම
5. නූතන පරම්පරාව ඉගෙනීමට ගැනීමට  අකමැති වීම
6. අමු ද්‍රව්‍ය මිළ ඉහළ යාම
7. සම්පත් හිඟ කම

## ශ්‍රී ලංකාවට කීර්තියක් ගෙන ඒමට හේතුවූ දෙවල්

1. කෙම් ක්‍රම හා හෙළ වෙදකම මගින් ලෙඩ සුව කිරීම. (යන්ත්‍ර මන්ත්‍ර, දේශීය වෛද්‍ය ක්‍රම)
2. ශාන්තිකර්ම ඇසුරින් ලෙඩ සුව කිරීම.
3. කැටයම් ඇසුරින් විවිධ නිර්මාණ කිරීම. (මගුල් පෝරු, පිරිත් මණ්ඩප, තොරණ)
4. විවිධ මාධ්‍ය භාවිතයෙන් අලංකාර භාණ්ඩ තැනීම. (පිඟන් මැටි ආදිය ඇසුරින්)
5. දේශීය දේ ඇසුරින් සංස්කෘතික අනන්‍යතාවය පිළිබිඹු වීම. (ජන ගී, ජන නැටුම්, ජන ක්‍රීඩා)
6. විවිධ මාධ්‍ය භාවිතයෙන් සියුම් නිර්මාණ කිරීම. (පිළිම, මූර්ති, වෙස් මුහුණු)

## සංස්කෘතික උරුම රැක බලා ගැනීමෙන් සිදුවන යහපත් දේවල්

1. රටේ අනන්‍යතාවය ආරක්ෂාවීම.
2. රටට කීර්තියක් ගෙන දීම.
3. සංස්කෘතිය දායාද කිරීම.
4. මානසික සුවයක් අත්විඳීම.
5. සංස්කෘතික වටිනාකම ඉහළයාම.


# ශ්‍රී ලංකාවේ ජන වර්ග වලට ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ

| ජන වර්ගය | ආගම | ආගමික ස්ථාන | ආගමික සංකේත | ආචාර විධි | ආගමික ශාස්තෘ වරු | ආගමික ග්‍රන්ථ |
|---|---|---|---|---|---|---|
| සිංහල | බෞද්ධ | පන්සල | ධර්ම චක්‍රය | ආයුබෝවන් කීම | බුදුරජාණන් වහන්සේ | ධම්ම පදය |
| දෙමළ | හින්දු | කෝවිල | ත්‍රිශූලය | වණක්කම් කීම | ශිව දෙවියන් | භගවත් ගීතාව |
| මුස්ලිම් | ඉස්ලාම් | මස්ජිදය | අඩ සඳ හා තනි තරුව | අස්ලාම් අලෛයුක්කුම් කීම | අල්ලාහ් දෙවියන් | අල් කුරාණය |
| බර්ගර් | ක්‍රිස්තියානි | පල්ලිය | කුරුසය | අතට අත දීම | යේසුස්/ක්‍රිස්තුස් වහන්සේ | බයිබලය |

- සිංහල ජාතිකයන් බෞද්ධ ආගමට අමතරව කතෝලික හා ක්‍රිස්තියානි ආගම් හා දෙමළ ජාතිකයන් හින්දු ආගමට අමතරව කතෝලික හා ක්‍රිස්තියානි ආගම් අදහනු ලබයි.


| ජන වර්ගය | ඇඳුම් පැළඳුම් | ආහාර වර්ග |
|---|---|---|
| සිංහල | පිරිමි - ජාතික ඇඳුම (ආරියසිංහල ඇඳුම)<br>ගැහැනු - ඔසරිය | කිරිබත්, කොණ්ඩ කැවුම්, මුං කැවුම් |
| දෙමළ | පිරිමි - වේට්ටිය හා බැනියම<br>ගැහැනු - සාරිය | තෝසේ, සාම්බාරු, වඩේ, ඉට්ලි, ලඩ්ඩු |
| මුස්ලිම් | පිරිමි - ජුබ්බා ඇඳුම සමඟ තොප්පිය<br>ගැහැනු - හබායා ඇඳුම සමඟ ඉජාහාප් පළඳනාව, ගැහැනු ළමයි - පර්දාව | බිරියානි, පරාටා, වටලප්පම් |
| බර්ගර් | පිරිමි - යුරෝපීය ඇඳුම (කලිසම, කමිසය, කබාය, කරපටිය)<br>ගැහැනු - ගවුම | කේක්, රෝල්ස්, පැටිස්, කට්ලට් |

| ආගම | ආගමික උත්සව |
|---|---|
| බෞද්ධ | වෙසක්, පොසොන්, කඨින පිංකම්, උපසම්පදා උත්සව |
| හින්දු | දීපාවලී, තෛපොංගල්, මහා ශිව රාත්‍රී දිනය, වෙල් උත්සව |
| ක්‍රිස්තියානි/කතෝලික | නත්තල්, පාස්කු, මහ සිකුරාදා, අළු බදාදා |
| ඉස්ලාම් | හජ්ජි, රාමසාන්,නබිනායකතුමාගේ උපන්දිනය |







සිංහල අනුවාදය සහිත
ධම්මපදය





BHAGAVAD
GITĀ AS IT IS
HIS DIVINE GRACE
A.C. BHAKTIVEDANTA SWAMI PRABHUPĀDA

Allah
is my only Hope.



අල් කුර්ආන්
අර්ථ සංග්‍රහය




HOLY
BIBLE

## අපේ රට යටත් කරගත් බටහිර ජාතීන්

1. පෘතුගීසි ක්‍රි.ව. 1505
2. ලන්දේසි ක්‍රි.ව. 1658
3. ඉංග්‍රීසි ක්‍රි.ව.1796

- මුළු දිවයිනම බටහිර ජාතීන්ට යටත් වූයේ ක්‍රි.ව.1815 දීය

## බටහිර ජාතීන් ගැන කියවෙන ගීත

1. යුද්දෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගිලා පරංගි
උන්නමුත් ඇවිත් කොළඹට ගොඩබැසලා
අන්දමත් සොඳයි කිසි බීසි ගාලා කොළඹදි
කම්පලක් නැතත් සෙනඟක් මරා දාලා

2. නොමදින් විකුම් පාලා
සැදෙමින් යුදට ජය ලන්දේසීන්
සමඟින් එ ජනරාලා
සමිඳුන්ගෙ භූමිපාලා
සියසෙන් අතින් මියැදී ගියෝ
යුදයෙන් ඇනුම් කාලා

## නිදහස වෙනුවෙන් කැපවූ ජන නායකයෝ



**1.** ගොංගාලේගොඩ බණ්ඩා



**2.** මොනරවිල කැප්පෙටිපොල



**4.** ඩී. එස්. සේනානායක මහතා



**5.** මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි

## විදේශීය ආක්‍රමණිකයන් අප රට යටත් කරගැනීමට ගත් පියවර වෙනස් කිරීමට කළ හැකි දේවල්

1. රටේ සශ්‍රීකත්වය නැති කිරීමට පිළිස්සූ මී ගස් නැවත සිටුවා පස සරු කිරීම.
2. භේද නොමැතිව සමගිව වැඩ කිරීම.
3. විදේශිකයන් අපට හුරු කළ මත්ද්‍රව්‍ය, දුම් වැටි වැනි දේ භාවිතයෙන් ඉවත් වීම.

## පරිපාලන ආයතන

1. නගර සභාව.
2. ප්‍රාදේශීය සභාව.
3. ප්‍රදේශීය ලේකම් කාර්යාලය.
4. පළාත් පාලන ආයතනය.

## අපට සේවා සපයන නිලධාරීන්

1. ග්‍රාම නිලධාරි
2. කෘෂිකර්ම උපදේශක
3. පවුල් සෞඛ්‍යසේවා නිලධාරිනී.
4. සමෘද්ධි නිලධාරී

## අපට සේවා සපයන රාජ්‍ය ආයතන

1. විදුලි බල මණ්ඩලය.
2. ජල ප්‍රවාහන මණ්ඩලය.
3. තැපැල් කාර්යාලය.
4. පොලිස් ස්ථානය.
5. බැංකුව.